ඇමුණුම - 03 ඇමුණුම - 3

# සමස්ත ලංකා සිගරට් දුම් උදුන් හිමි සංගමය
# All Ceylon Cigarette Tobacco Barn Owner's Association

---

2015 නොවැම්බර් 29

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා,
ජනාධිපති මන්දිරය,
පොළොන්නරුව.

අතිගරු ජනාධිපතිතුමණි,

**<u>දුම්කොළ ගොවීන්ට උද්ගතව ඇති ගැටළු පිළිබඳ අවධානය යොමුකරන ලෙස කරනු ලබන අභියාචනයයි</u>**

මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳව වූ ජනාධිපති කාර්යය සාධක බළකාය මගින් ඉදිරිපත් කරනලද නිර්දේශ අනුව මෑතක දී එළි දක්වන ලද මත්ද්‍රව්‍ය නිවාරණය කිරීමේ ජාතික ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී වැඩ පිළිවෙල මගින් සිදුකර ඇති ඇතැම් නිර්දේශ මගින් දුම්කොළ වගාවට සහ එම වගාවෙන් යැපෙන ගොවීන් වෙත සෘජු හා ක්ෂණික බලපෑමක් එල්ලවන තත්ත්වයක් උද්ගත වී ඇත.

දැනට මෙම නිර්දේශ නීති සම්පාදනය සඳහා කෘෂිකර්මයට සම්බන්ධ නිළධාරීන් වෙත යොමු කර ඇති අතර, එමගින් යල් කන්නයේ ජලය හිඟ කුඹුරු ඉඩම් වල කාලාන්තරයක් තිස්සේ කරගෙන එනු ලබන දුම්කොළ වගාවට ප්‍රබල තර්ජනයක් එල්ලවීම මගින් ගොවීන්ගේ ආදායම් මාර්ග ක්ෂණිකව අහිමිවයාමේ තර්ජනයක් මතුව ඇති බව අපගේ හැඟීමයි.

එබැවින් පහත සඳහන් කරුණු ඔබතුමාගේ කාරුණික අවධානයට යොමු කරණු කැමැත්තේමු.

1 - වසර 80 කට පමණ පෙර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම මත හඳුන්වාදෙන ලද ආර්ථික බෝගයක් වන මෙය මගින් පරම්පරා 3 කට ආසන්න පිරිසක් සිය ජීවිකාව සරිකරගෙන ඇත. අද වන විට මෙම වගාව හරහා වාර්ෂිකව ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථිකයට රුපියල් කෝටි 150 (දසලක්ෂ 1,500) ක් පමණ මුදාහැරෙන අතර පුද්ගලයින් 60,000 කට පමණ රැකියා අවස්ථා ජනිත කරනු ලබයි. මේ මගින් 300,000 කට ආසන්න පිරිසක් යැපෙන්නන් ලෙස ප්‍රතිලාභ සළසා ගනිති.

2 - සිගරට් දුම්කොළ වගාව ලංකා දුම්කොළ සමාගම සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචිවී ගොවීන් විසින් සිදුකරගෙන යනු ලබන අතර අදාල නියාමන හා අධීක්ෂණ කටයුතු කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබයි.

3 - පිළිගත් ආර්ථික බොගයක් ලෙස දශක 8 කට ආසන්න කාලයක් පැවති මෙම බෝගය වැවීම හා නිෂ්පාදනය කිරීම සඳහා දුම්කොළ ගොවිමහතුන් සැළකිය යුතු ලෙස විශාල මුදල් ආයෝජන සිදුකර දුම්කොළ පදම් කිරීමේ හා සැකසීමේ මධ්‍යස්ථානද පවත්වාගෙන යනු ලබයි. මෙම මධ්‍යස්ථාන හරහා ශ්‍රමිකයින් විශාල පිරිසක් සිය රැකිරක්ෂා අවස්ථා සලසා ගනු ලබන අතර එය අවාරයේදී ආදායමක් ලබන ප්‍රධාන කර්මාන්තය බවට පත්ව ඇති ප්‍රදේශ සැලකිය යුතු ප්‍රමාණයක් අදටත් දක්නට ඇත. මෙසේ නිෂ්පාදනය කරණු ලබන දුම්කොළ සඳහා දැරීමට සිදුවන පිරිවැය නිරතුරුව තක්සේරු කර වාර්ෂිකව යාවත්කාලීන කරන ලද සහතික මිලකට මිලට ගැනීම හරහා දුම්කොළ ගොවීන් වෙත ස්ථිර ආදායමක් ලබා දීම, මේ වගාව සඳහා ගොවීන් පෙළඹීමට ඇති ප්‍රධානම සාධකය වේ.

4 - නිෂ්පාදනයේ අතිරික්තයක් පැවතියද නිෂ්පාදනය කරනු ලබන සමස්ත අස්වැන්නම සහතික මිලටම විකුණාගැනීමට ඇති හැකියාවද ආකර්ෂණීය සාධකයකි.

---


<u>සම සභාපති</u>
ජේ.ඊ.එගොඩවෙලේ (081-3847141)
ඩබ්.එම්.සෝමරත්න (071-5884062)

<u>සම ලේකම්</u>
ජෝර්ජ් තිසිවාසල (081-3840797)
ඩබ්.එම්.ගුණරත්න (077-7469076)

<u>සම භාණ්ඩාගාරික</u>
එන්.එච්.සුනිල් ද සිල්වා (081-4917168)
ට.ඊ.විදුස්සූරිය (072-4256475)

5 - අද වන විට ලංකාවේ සිගරට් නිෂ්පාදනයට අවශ්‍ය දුම්කොළ 100% ක්ම සපයනු ලබන්නේ දේශීය නිෂ්පාදකයන් විසිනි. සිගරට් හෝ දුම්කොළ ආනයනයෙන් රටට වැය විය හැකි විශාල විදේශ විනිමය ප්‍රමාණයක් එමගින් ඉතිරිකර දීමට දුම්කොළ ගොවීන් සමත්ව ඇත.

6 - ලංකාවේ වාර්ෂික බෝග වගාකරනු ලබන ඉඩම් ප්‍රමාණය සැලකූවිට දුම්කොළ වගාව සඳහා යොදාගනු ලබන්නේ ඉතාම සීමිත, නොගිනිය හැකි තරම් සුළු ඉඩම් ප්‍රමාණයක් වන අතර, එය ප්‍රතිශතයක් ලෙස 0.01% පමණ වේ. දුම්කොළ වගාව සඳහා ප්‍රසිද්ධ දිස්ත්‍රික්කයක් වන පොළොන්නරුවේ ද මෙම අගය 0.7% ක් පමණ තරම් වූ පහල අගයක පවතී.

7 - දුම්කොළ වගාව පොළොන්නරුව, බදුල්ල, අනුරාධපුර, අම්පාර, මොණරාගල, මාතලේ, මහනුවර, නුවරඑළිය හා කුරුණෑගල යන දිස්ත්‍රික්ක වල දැනට සිදුවන අතර එම වගාව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඍජු නියාමනයට යටත්ව ප්‍රධාන වශයෙන් යල් කන්නයේ ජලය හිඟ කුඹුරු ඉඩම් වල සිදුකරනු ලබයි.

8 - වගාවට නිරන්තරව හඳුන්වාදෙනු ලබන ඵලදායිතාවය ඉහල නැංවීමේ වත් පිළිවෙත් හේතුකොට ගෙන වගාවට අවශ්‍ය ඉඩම් ප්‍රමාණය අවම මට්ටමක පවත්වාගැනීමට නිරන්තරයෙන් අප කටයුතු කර ඇත.

9 - වී වගාව සඳහා ඉතා සුදුසු ඉඩම් දුම්කොළ වගාව සඳහා නොගැලපෙන අතර, දුම්කොළ සඳහා භාවිතා කරන්නේ ජල හිඟය නිසා වී වගා කිරීම අවදානම් සහගත ඉඩම් වල බව අවධාරණය කරමු. එසේම වී හෝ වෙනත් ක්ෂේත්‍ර බෝගයක් වගාකිරීමේ දී සත්ත්ව හානි වලට ලක්වන ආන්තික ඉඩම් වලද මෙම වගාව සිදුකරනු ලබයි.

10 -දුම්කොළ වගාකරන වෙනත් රටවල් වල දුම්කොළ වියලීමට විවිධ ඉන්දන ප්‍රභවයන් යොදාගත්තත්, ලංකාවේ දහයියා භාවිතයෙන් දුම්කොළ වියලීමට යොමුවීම මගින් පරිසර හිතකාමී ක්‍රම ඔස්සේ දුම්කොළ වියලීම සිදුකරනු ලබයි.

11 - කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ප්‍රවීනයන් විසින් නිර්දේශ කරන ලද කරුණු සැළකිල්ලට ගෙන කාලීන අවශ්‍යතාවයක් ලෙස සලකා මේ වන විට දුම්කොළ වගාව සමග අතුරුභෝග සිටුවීමේ වැඩපිළිවෙලක් ද අපි විසින් දියත්කර ඇත. මේ වන විට එය ඉතා සාර්ථක මට්ටමකින් ක්‍රියාත්මකව පැවතීමද සැලකිය යුතු කරුණකි.

මත්ද්‍රව්‍ය නිවාරණය කිරීමට ජාතික ප්‍රතිපත්තියක් හඳුන්වා දීම පිළිබඳව සතුටු විය හැකිමුත් ගොවීන්ගේ ආදායම් මාර්ග අහිමිව යාමේ තර්ජනය පිළිබඳව සුළුකොට තැකිය නොහැකි බව අපගේ හැඟීමයි.

රජයේ අවශ්‍යතාවය මත මෙම වගාව නවත්වන්නේ නම් ඒ සඳහා යොමුව ඇති ගොවීන් විසින් සිදුකර ඇති ආයෝජනයන්ට සහ ඔවුන්ගේ ආදායම් මාර්ග අහිමිව යාමට සරිලන වන්දියක් ද, විකල්ප ආදායම් මාර්ග ද, සකස්කර දීම රජයේ වගකීමක් බව අපි සිතමු. වක්‍ර ආකාරයෙන් වගාව අඩාල කිරීමට කටයුතු කිරීම මගින් මින් යැපෙන්නන් අගතියට පත්වන අතර, ඔවුන් සඳහා සාධාරණයක් ද ඉෂ්ඨ නොවන බව අපගේ හැඟීමයි.

සිගරට් කර්මාන්තය පවතිනතාක් අමුද්‍රව්‍යයක් ලෙස දුම්කොළ නිපදවීමේ අවශ්‍යතාවය නොවෙනස්ව පවතිනු ඇත. එම අවස්ථාව ප්‍රයෝජනයට ගෙන රජයට ද බරක් නොවී ආදායමක් උපදවා ගැනීමට ගොවීන්ට ඇති අවස්ථාව ආරක්ෂාකර දීමට මැදිහත්වන ලෙස ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

ස්තූතියි.


..............................
ජේ.ඒ.එගොඩවෙලේ
සම සභාපති

ජේ. ඒ. එගොඩවෙලේ

..............................
ජෝර්ජ් නිසිවාසල
සම ලේකම්

..............................
එන්.එච්.සුනිල් ද සිල්වා
සම භාණ්ඩාගාරික

..............................
ඩබ්.එම්.සෝමරත්න
සම සභාපති

..............................
ඩබ්.එම්.ගුණරත්න
සම ලේකම්

..............................
ඊ.ඒ.විදුස්සූරිය
සම භාණ්ඩාගාරික